"දැව කර්මාන්තයේ නායකත්වය"

# රාජ්‍ය දැව සංස්ථාව

## පරිසර අමාත්‍යාංශය

## පුරප්පාඩු

රාජ්‍ය දැව සංස්ථාවේ පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 1. සාමාන්‍යාධිකාරි - *(HM 2-2)*

- **<u>අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්</u>**

**1.** විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාව / කෘෂිකර්මය / ව්‍යාපාර පරිපාලනය හෝ කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබා තිබිම.

**සහ**

විද්‍යාව / කෘෂිකර්මය / ව්‍යාපාර පරිපාලනය /කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබිම හෝ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආයතනික සාමාජිකත්වයක් ලබා තිබිම.

**සහ**

ප්‍රථම උපාධි සුදුසුකම ලබාගැනිමෙන් පසු සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වෙළෙඳ ආයතනයක" කළමනාකරණ මට්ටමේ" තනතුරක අවම වශයෙන් වසර විස්සක (20) පළපුරුද්දක් ලබා තිබීම හා ඉන් වසර පහක් (05) ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරක පළපුරුද්දක් ලබා තිබිම.

**හෝ**

**2.** විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාව / කෘෂිකර්මය / ව්‍යාපාර පරිපාලනය හෝ කළමනාකරණය පිළිබඳ උපාධියක්

**සහ**

විද්‍යාව / කෘෂිකර්මය / ව්‍යාපාර පරිපාලනය/ කළමනාකරණය පිළිබඳ ආචාර්ය උපාධියක් ලබා තිබිම.

**සහ**

ප්‍රථම උපාධි සුදුසුකම ලබාගැනිමෙන් පසු සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වෙළෙඳ ආයතනයක "ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ" තනතුරක අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්දක් ලබා තිබීම

- **වැටුප් පරිමාණය** : HM 2-2 – 2025 රු. (163,620 – 4,850 × 12 = 221,820)
  ( කළමනාකරණ සේවා චක්‍රලේඛ **01/ 2025 හි II** උපලේඛනය අනුව **2025.01.01** දින සිට)

- **වයස් සීමාව** : අවු. **35** සිට **55** දක්වා

## *2.* අතිරේක සාමාන්‍යාධිකාරි (HM 2-1)

- **<u>අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්</u>**

**1.** විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාව / කෘෂිකර්මය/ කළමනාකරණය / ව්‍යාපාර පරිපාලනය/ රාජ්‍ය කළමනාකරණය/රාජ්‍ය පරිපාලනය හෝ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබා තිබිම.

**සමඟ**

අදාල ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබිම හෝ තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නාවූ , පිළිගත් වරලත් වෘත්තිය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වයක් (Associate Membership) ලබා තිබිම.

**සහ**

සංස්ථාවක , ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ " තනතුරක අවම වශයෙන් වසර දහඅටක (18) ක පළපුරුද්දක් ලබා තිබිම හා ඉන් වසර පහක් (05) ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරක පළපුරුද්දක් ලබා තිබිම.

**හෝ**

**2.** තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ , පිළිගත් වරලත් වෘත්තිය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබිම

**සහ**

සංස්ථාවක , ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ " තනතුරක අවම වශයෙන් වසර දහඅටක (18) ක පළපුරුද්දක් ලබා තිබිම හා ඉන් වසර පහක් (05) ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරක පළපුරුද්දක් ලබා තිබිම.

**හෝ**

3. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාව / කෘෂිකර්මය/ කළමනාකරණය / ව්‍යාපාර පරිපාලනය/ රාජ්‍ය කළමනාකරණය/රාජ්‍ය පරිපාලනය හෝ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

**සහ**

ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ ඕනෑම ආචාර්ය උපාධියක් ලබා තිබීම.

**සහ**

ප්‍රථම උපාධි සුදුසුකම ලබාගැනීමෙන් පසු සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වෙළෙඳ ආයතනයක "ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ" තනතුරක අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්දක් ලබා තිබීම

- **වැටුප් පරිමාණය** : HM 2-1 – 2025 රු. (161,140 – 4,850 × 12 = 219,340)
  **( කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/ 2025 හි II උපලේඛනය අනුව 2025.01.01 දින සිට)**

- **වයස් සීමාව** : **අවු. 35 සිට 55 දක්වා**

## *3.* සහකාර කළමනාකාර (මානව සම්පත්) -(JM 1-1)

- <u>අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්</u>

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය /රාජ්‍ය කළමනාකරණය/ව්‍යාපාර පරිපාලනය පිළිබඳව උපාධියක් ලබා තිබීම.

- **වැටුප් පරිමාණය** **:JM 1-1 –රු .(72,650 – 1,360×10 – 2,040×18 – 122,970)**
  **( කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/ 2025 හි II උපලේඛනය අනුව 2025.01.01 දින සිට)**

- **වයස් සීමාව** : **අවු. 22 සිට 45 දක්වා**

<u>වෙනත් ප්‍රතිලාභ</u>

- සේවකයන් සහ යැපෙන්නන් සඳහා වෛද්‍ය රක්ෂණාවරණ
- වාර්ෂික ප්‍රසාද දීමනා
- පැමිණීමේ දිරිදීමනා
- නිවාස ණය සහ වෙනත් ණය පහසුකම්
- සේ.අ.අ. සහ සේ.භා.අ. සඳහා දායකත්වය

රාජ්‍ය දැව සංස්ථාව පිළිබඳ විස්තර, තනතුරුවලට අදාල රාජකාරි, වගකීම් සහ සේවා කොන්දේසි සහ ආදර්ශ අයදුම්පත්‍රය වෙත පිවිසීමට පහත සපයා ඇති **QR** කේතය ස්කෑන් **(Scan)** කරන්න.

**අයදුම්කල යුතු ආකාරය**

අයදුම්කරුවන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලව සකස් කරන ලද අයදුම්පත සහ **මූලික සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාල සහතිකවල සහතික කල පිටපත් 2026 මැයි 20** වන දින හෝ ඊට පෙර ලැබෙන පරිදි **නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ( මානව සම්පත් හා පාලන) , රාජ්‍ය දැව සංස්ථාව, අංක 82, රජමල්වත්ත පාර, බත්තරමුල්ල** යන ලිපිනයට **ලියාපදිංචි තැපෑලෙන් පමණක්** එවිය යුතුය. අයදුම්පත එවනු ලබන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම්කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

සැ.යු - අපැහැදිලි, අසම්පූර්ණ හා ප්‍රමාද වී ලැබෙන හෝ මූලික සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් පූර්ව දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ .

**සභාපති - රාජ්‍ය දැව සංස්ථාව**